## 374 ලෝ දනා ගලවන ලෙසා

ලෝ දනා ගලවන ලෙසා රුදු වේදනා විඳලා
පාපයේ බරිනා වෙලී දෙරනේ හැපී වැටිලා
ලේද දහදිය සිඳ හෙලා උස් ගොල්ගොතා නැගලා
ආ මගේ සමිඳා සිටී කුරුසේ දුකින් පිරිලා

ජීවනේ ගෙනදුන් සදා පා සෙනේ ලොවටා //
ජේසුනේ මගෙ ස්වාමිනේ කිම මේ වුණේ ඔබටා //

රන් කඳා විලසේම සුදිලුණු සිරි ගතා පොඩිවී
පුන් සඳා පරදා එදා දිසි සිරි වතා මැලවී
නන් ලෙසේ රස බස් දෙසූ සියුමැලි දෙතොල් කළුවී
දැන් කෙසේ නෙත් හැර බලම් කඳුලෙන් දෙනෙත් නොතෙමී

රජුන්ගේ රජවූ තිලෝනා දෙව් පුතුන් මෙලෙදා
සොරුන්ගේ සොර දෙටු කියා වින්ඳා මහා නින්දා
සොරුන් දෙදෙනෙකු මැදට වී ඇණ ගැසී මා හින්දා
මැරුම් කෑ සැටි අහෝ මා හද තවයි සෝ ගිනිදා

ලෝක පාලක දෙව් පුතා පියවා ගතී දෙනෙතා
ලෝකයේ ආලෝකයේ රුස් හැකුළුනේ නියතා
ලොවට සාමය දුන් එ'කුමරා කුරුසයේ නැසුනා
සකල ලෝකය අවමඟුල් බෙර වයන හඬ ඇසුනා